# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
# வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
# Department of Trade and Investment Policy

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
Ministry of Finance

මහලේකම් කාර්යාලය කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo - 01


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | TIP/TP/01/86 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.11.17 |

රජයේ මුද්‍රණාලයාධිපති

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මියණි

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ වන ගැසට් නිවේදනය**

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත 14 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාගේ ද එකඟත්වය ඇතිව, වෙළඳ අමාත්‍යතුමා විසින් සෙස් බද්ද ක්‍රියාත්මක කිරීමට සකස් කරන ලද නියෝගය **2020.11.17** දිනැති අංක 2202/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 525 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ පිටපත් 25 ක් ලේකම්, වෙළඳ අමාත්‍යාංශය වෙත ද එවනු මැනවි.

මෙම ගැසට් නිවේදනය 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතුව ඇති බැවින්, මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**කේ. ඒ. විමලේන්තිරරාජා**
අධ්‍යක්ෂ ජනරාල්

O/C

**පිටපත්**

- රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමග එවනු ලබන 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා
- ලේකම්, වෙළඳ අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව- වෙබ් පිටුවේ පළකිරීම සඳහා


දුරකථන අංකය / தொலைபேசி / Telephone: 0112 484 888
ෆැක්ස් / தொலைநகல் / Fax: 0112 484 962, 0112 484 830
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail: admin@tipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk